ස්වර ලිපි කියවීමේ ක්‍රම ශිල්ප

- **<u>තාලයේ වේගය - ලය (Tempo)</u>**

ස්වර ප්‍රස්ථාරයක් කියවීමේ දී හෝ වාදනය කිරීමේ දී අදාල ගීතය වාදනය කළ යුතු වේගය පිළිබඳ සැළකිලිමත් විය යුතු ය . එය පෙරදිග සංගීතයේදී ලය යනුවෙන් ද බටහිර සංගීතයේ දී **<u>Tempo</u>** නමින් ද හඳුන්වයි. ගුවන්විදුලි ගීතයක ස්වර ප්‍රස්ථාරයක් වාදනය කරන්නේ නම් ගීතය අසා අදාල වේගය මතකයේ රඳවා ගත යුතු ය. බටහිර සංගීතයේ දී මෙය ට සම්මත ක්‍රමයක් ඇති අතර එය Metronome නම් උපකරණයකින් ගණනය කරයි.

පෙරදිග ව්‍යවහාරික සංගීතයේ දී විලම්භ ලය යන පදයෙන් අඩු වේගය ත් මධ්‍යලය යන පදයෙන් සාමාන්‍ය වේගයත් දෘත ලය යන පදයෙන් වැඩි වේගයත් හඳුන්වයි.

<u>පෙරදිග ස්වර ප්‍රස්ථාරයක සාමාන්‍ය ව්‍යවහාරික ආකෘතිය</u>

ගීතයේ නම තාලය ප්‍රධාන ශ්‍රැතිය

ආරම්භක වාදනය (INTRODUCTION)

ස්ථායී කොටස CHORUS

පළමු අතුරු වාදනය 1ST INTERLUDE

පළමු අන්තරා කොටස 1ST VERSE

දෙවන අතුරු වාදනය 2ND INTERLUDE

දෙවන අන්තරා කොටස 2ND VERSE

මීට අමතරව පහත අවස්ථා ද ඇත

[මෙම වරහන් යුගලට මැදි වූ ප්‍රස්ථාර කොටස දෙවරක් වාදනය කළ යුතු ය]

$ **(සයින් ටු සයින්)** . මෙම සංකේතය සඳහන් ස්ථානයේ සිට නැවත මෙම සංකේතය සඳහන් වන ඉහත ස්ථානයට ගොස් වාදනය කිරීම.